# ජාතික විද්‍යා පදනම
# தேசிய விஞ்ஞான மன்றம்
# National Science Foundation

NATIONAL SCIENCE FOUNDATION

ජාතික විද්‍යා පදනම යනු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ පනත මගින් ස්ථාපිත රාජ්‍ය අරමුදල් ලබනා ආයතනයකි. එහිදී ජාතික විද්‍යා පදනම ශ්‍රී ලාංකික ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා දැනුම උත්පාදනය, ව්‍යාප්තිය සහ දැනුම් පැවරීම මෙන්ම විශේෂයෙන්ම වඩා ඵලදායී ලෙස දැනුම භාවිතය සහතික කිරීම වෙනුවෙන් කැපව කටයුතු කරයි. පදනම සැම විටම මූලික සහ ව්‍යවහාරික විද්‍යාවන් මෙන්ම සමාජ විද්‍යාවන් යන ක්ෂේත්‍රයන්හි ද පර්යේෂණ සඳහා සහය ලබාදෙයි.

පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිළධාරී (01)**

1) විද්‍යාව/කෘෂි විද්‍යාව/ව්‍යාපාර පරිපාලනය හෝ අන් කවරම හෝ අදාල ක්ෂේත්‍රයක විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාවේදී උපාධියක්

**සහ**

අ) විද්‍යාව/කෘෂි විද්‍යාව/ව්‍යාපාර පරිපාලනය හෝ අන් කවරම හෝ අදාල ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ කළමණාකරනය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක සංස්ථාපිත සාමාජිකත්වය

**සහ**

ආ) කළමණාකාරීත්ව මට්ටමේ අවම වශයෙන් වසර 20ක පළපුරුද්ද- මින් වසර පහක සේවා කාලයක් පළමු උපාධිය ලබාගැනීමෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක පිළිගත් සේවා වාර්තාවක් සහිතව ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්ව මට්ටමේ පළපුරුද්ද සහිතව විය යුතුය.

**හෝ**

2) විද්‍යාව/කෘෂි විද්‍යාව/ව්‍යාපාර පරිපාලනය හෝ අන් කවරම හෝ අදාල ක්ෂේත්‍රයක විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාවේදී උපාධියක්

**සහ**

විද්‍යාව/කෘෂි විද්‍යාව/ව්‍යාපාර පරිපාලනය හෝ අන් කවරම හෝ අදාල ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්

**සහ**

පළමු උපාධිය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර පහක සේවා කාලයක් සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක පිළිගත් සේවා වාර්තාවක් සහිතව ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්ව මට්ටමේ පළපුරුද්ද සහිතව විය යුතුය.

**වයස් සීමාව :**

වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය සහ කේතය :**

HM 2-3 රු: (98,215/- 12×2,700 – 130,615/-)
(**මූලික වැටුප 2017** - රු.67,633/-)

තනතුරට හිමිවන වරප්‍රසාදයන් EPF/ETF, මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලබන ප්‍රවාහණ සහ සන්නිවේදන පහසුකම් ඇතුලත් වේ. තෝරා ගනු ලබනා අපේක්ෂකයා ඉහත සඳහන් වැටුපට අමතරව රජය මගින් කලින් කලට ප්‍රකාශයට පත් කරනු ලබනා දීමනා /ජීවන වියදම් දීමනාවන්ට හිමිකම් ලබයි.

ජීව දත්ත විස්තර සහ ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග ලියාපදිංචි තැපෑලෙන් අයදුම් කල යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරෙහි අයදුම් කරනු ලබනා තනතුර සඳහන් කල යුතුය. අයදුම්කරුවන් පිළිබඳව කරනු ලබනා කවර හෝ බලපෑම් තනතුර සඳහා තෝරා ගනු ලැබීමට නුසුදුසුකමක් වනු ඇත.

රජයේ සහ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාල ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. ජාතික විද්‍යා පදනම සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු www.nsf.ac.lk වෙබ් අඩවියෙන් පරිශීලනය කල හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සභාපති, ජාතික විද්‍යා පදනම, අංක 47/5 මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට එවිය යුතුය.

**අයදුම් පත් භාර ගන්නා අවසන් දිනය : 2017-04-24**

**සභාපති**
**ජාතික විද්‍යා පදනම**
**අංක 47/5, මේට්ලන්ඩ් පෙදෙස,**
**කොළඹ 07.**

**47/5, Maitland Place, Colombo 07, Sri Lanka**
**Tel : +94 11 2696771-3, e mail: info@nsf.ac.lk, www.nsf.ac.lk**